## පිවිතුරු බලශක්ති ප්‍රවේශයන් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

### 1. මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගත වන ගැටළුවලින් ඇතිවන බලපෑම හැරුණු විට මා දරන්නාවූ මතය වනුයේ ,

(අ) 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2010 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමෙහි නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතින්වලට අනුකූල වී තිබුණු බවත්ය.

### 2. මූල්‍ය ප්‍රකාශන

#### 2.1 මූල්‍ය කාර්ය සාධනය

මූල්‍ය ප්‍රකාශන සහ විගණනයට ලබා ගත හැකි වූ තොරතුරු වලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු: 171,855,065 ක් හා ඉකුත් වර්ෂය සඳහා වියදම රු:27,274,134 ක් වූ අතර 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු:203,684,155 ක් විය. විස්තර පහත දැක්වේ.

| ක්‍රියාකාරකම් | 2010 වර්ෂය සඳහා වියදම | 2009 වර්ෂය සඳහා වියදම | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | රු: | රු: | රු: |
| පාලන පද්ධති නවීකරණයන් | 33,864,605 | 1,117,806 | 34,982,411 |
| සම්ප්‍රේෂණ පද්ධති - සම්ප්‍රේෂණ රැහැන් ශක්තිමත් කිරීම | 39,085,249 | 9,969,056 | 49,054,305 |
| සම්ප්‍රේෂණ පද්ධති - ග්‍රිඩ් උප පොළ ශක්තිමත් කිරීම | 34,176,739 | 4,644,732 | 38,821,471 |
| පුනර්ජනනීය බලශක්ති සඳහා ජාල ධාරිතා වර්ධනය | 32,211,070 | 8,825,261 | 45,591,287 |
| පාලන පද්ධති නවීකරණය සඳහා උපදේශක සේවා | 3,905,274 | - | 3,905,274 |
| නැගෙනහිර පලාතේ සම්ප්‍රේෂණ පද්ධති ශක්තිමත් කිරීම | 30,073,505 | 3,687,490 | 33,760,995 |
| **මුළු වියදම** | **173,316,442** | **28,244,345** | **206,115,743** |
| අඩු කළා - වෙනත් ආදායම හා ලාභ | (1,461,377) | (970,211) | (2,431,588) |
| **මුළු ශුද්ධ වියදම** | **171,855,065** | **27,274,134** | **203,684,155** |

## 3. විගණන නිරීක්ෂණ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අදාල නොවන පරිදි ව්‍යාපෘතියේ කෙරි ගෙන යන වැඩ වලට හර කරන ලද 2008 හා 2009 වර්ෂවලට අදාල පිළිවෙලින් රු: 4,554,956 ක් හා රු:27,274,134 ක් වු පූර්ව ව්‍යාපෘති වියදම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර තිබුණි. එම වර්ෂ දෙක සඳහා වෙනම මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබිණි. මූල්‍ය ප්‍රකාශන හා අදාල ලියකියවිලි නොලැබීම හේතුවෙන් මෙම වියදම් පිළිබඳ නිරවද්‍යතාවය විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කල නොහැකි විය.

(ආ) 2010 වර්ෂය සඳහා රජයේ වාර්ෂික ඇස්තමේන්තුවල මෙම ව්‍යාපෘතියට අදාලව උපදේශන සේවා සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණද , එම කාරණය සඳහා රු:24,459,531 ක මුදලක් වැය කර තිබුණි.

(ඇ) අමාත්‍යාංශය හා මහා භාණ්ඩාගාරය විසින් පවත්වා තිබුණු වාර්තා සමග ව්‍යාපෘතියේ වාර්තා සසදා නොතිබුණි. එම වාර්තා අතර නිරීක්ෂණය වු වෙනස්කම් පහත දැක්වේ.

| කොටස | ක්‍රියාකාරකම් | ව්‍යාපෘති ගිණුම් අනුව රු: | අමාත්‍යාංශ/ භාණ්ඩාගාර වාර්තා අනුව රු: | වෙනස රු: |
|---|---|---|---|---|
| 2 | සම්ප්‍රේෂණ පද්ධති - සම්ප්‍රේෂණ රැහැන් ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය | 178,471,644 | 120,806,003 | 57,665,641 |
| 6 | ජාල ධාරිතාවය - පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති වර්ධනය | 227,874,827 | 310,000,000 | 82,125,173 |

## 4. භෞතික කාර්ය සාධනය

විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතියේ භෞතික කාර්ය සාධනය පහත දැක්වේ.

| කොටස | ක්‍රියාකාරකම් | 2010 දෙසැම්බර් 31 දිනට කාර්ය සාධනය |
|---|---|---|
| | **බලශක්ති කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම** | |
| 1 | පාලන පද්ධති නවීකරණය | ඉතා වැදගත් කාර්යයන්හි කාර්යසාධනය ඉලක්කගත තත්වයන්ට වඩා අඩු මට්ටමක විය. |
| 2 | සම්ප්‍රේෂණ පද්ධතිය ශක්තිමත් කිරීම. | |
| | (අ) හොරණ , වේයන්ගොඩ හා කුරුණෑගල පිහිටි උපපොළවල් වර්ධනය කිරීම. | ඉඩම් අත්පත්කර ගැනීම හා ගොඩනැගිල්ලක් ඉදි කිරීම් කටයුතු සිදු වෙමින් පවතී. |
| | (ආ) හබරණ , පානදුර, මාතර , පුත්තලම හා ගාල්ල නව - උපපොළවල් ඉදි කිරීම | ඉදි කිරීම් කොන්ත්‍රාත්තු ප්‍රදානය කළ යුතුව ඇත. |
| 3 | බෙදා හැරීම් උපපොළ වර්ධනය. | |
| | කටුනායක , නාවල , කිරිබත්ගොඩ , කොටිකාවත්ත , හා හික්කඩුව උපපොළවල ධාරිතාවය වර්ධනය. | තොරතුරු ලැබී නොමැත. |
| 4 | නාගරික වීථි ආලෝකකරණය සඳහා ඉල්ලුම්පැති කළමනාකරණය | ආරම්භ කර නොතිබුණි. |
| 5 | උපදේශක සේවා | සමහර ඉතා වැදගත් ක්‍රියාකාරකම්වල කාර්ය සාධනය ඉලක්කගත දිනවලට පිටුපසින් විය. |

**<u>පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය</u>**

| | | |
|---|---|---|
| 6 | පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා ජාල ධාරිතා වර්ධනය | |
| | (අ) බලන්ගොඩ , සීතාවක , නුවරඑළිය , හා උකුවෙල පිහිටි බදුල්ල උපපොළවල් වර්ධනය | 2010 අගොස්තු 18 දින කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර ඇත. |
| | (ආ) මහියංගන උප-පොළ ඉදි කිරීම | රු:227,874,827 ක්වූ අත්තිකාරමක් ගෙවා තිබුණි. |

**<u>අඩු ආදායම්ලාභීන් සඳහා ප්‍රවේශය</u>**

| | | |
|---|---|---|
| 7 | නැගෙනහිර පළාතේ සම්ප්‍රේෂණ පද්ධතිය ශක්තිමත් කිරීම. | |
| | (අ) අම්පාර සහ වාලච්චේන උප -පොළවල් වර්ධනය | මෙතෙක් ආරම්භ කර නොතිබුණි. |
| | (ආ) හබරන - වාලච්චේන කොටසේ සම්ප්‍රේෂණ රැහැන් ඉදි කිරීම | හබරන - වාලච්චේන සම්ප්‍රේෂණ රැහැන් පිළිබඳ ප්‍රාථමික සමීක්ෂණය සම්පූර්ණ කර ඇත.(කි මී 100) |
| 8 | ග්‍රාමීය ගෘහ සම්බන්ධතාවයන් | මෙතෙක් ආරම්භ කර නොතිබුණි. |

## 5. පද්ධති හා පාලන

පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) තොග වාර්තා පවත්වා ගැනීම

(ඇ) කාර්ය සාධන සමාලෝචනය